# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,580 — 1958 නොවැම්බර් 7 වැනි සිකුරාදා — 7.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඹ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1958 අංක 493**

අ.ආ.කා. අංකය : **N 89/58.**

1948වේ අංක 17 දරණ පරීක්ෂණ කොමිෂන් සභා ආඥ පනතේ 17 (1) වැනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, අධිකරණ අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැන්පත් (ශ්‍රේස් ඉන්හි) අධිනීතිඥ සිවානන්ද කනගරායර්, බී.ඒ. (ලන්ඩන්), ඇල්.ඇල්.බී. මහතා, 1958 වෙ නොවැම්බර මස 1 වැනි දින සිට මරණ දඬුවම ගැන පරීක්ෂාකර වාර්තා කිරීමේ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත්කරනු ලැබ සිටී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදී,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 වෙ නොවැම්බර මස 5 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍ය්‍යාලය.

# මිල පාලන දැන්වීම්

**ඇම් ඩී./11/58 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන්පත් හෙට්ටිගේ දෙන් ටියුඩර් බෝදිදස වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි සහ 3 (2) යන කොටස්වලින් මා වෙත පැවරී තිබෙන බලතල අනුව —

(1) 1958 අගෝස්තු 23 වෙනි දින අංක 11,489 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 අගෝස්තු 18 වැනි දින ඇම්.ඩී/9/58 දරණ ආහාර මිළ නියෝගයේ 1 වෙනි සහ 2 වෙනි උපලේඛනවල 11 වැනි තීරයේ සඳහන් අර්තාපල් පිළිබඳව එම උප ලේඛනවල පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිලද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනවල 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීමෙ දී ශුද්ධ බර හොණ්ඩරයක්ද සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක්ද එම උපලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල මෙ දුන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උප ලේඛනයේ සඳහන් ද්‍රව්‍යය පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි,

3337—ජේ. ඇන්. ආර් 26798—5,021 (11/58)

(5) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම් කරණු ලැබූ සැම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සැම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ සැම ප්‍රදේශයකම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වශයෙන් විකුණන සැම තැනැත්තකු හා උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය සිල්ලර වශයෙන් විකුණන සැම තැනැත්තකු විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වාභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ;

(ඉ) විකුණූ ද්‍රව්‍යය පිළිබඳව විස්තරය ඇතුළත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දියයුතු බව නියම කරමි.

(8) මෙම උප ලේඛනවල 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් මෙහි උප ලේඛනවල 2 වැනි තීරයේ සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(9) ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(10) චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(11) ජපානයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් විසිපහක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(12) ලෑලි පෙට්ටිවල හැර වෙනයම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(13) මෙම නියෝගය සඳහා '' ශුද්ධ '' යන්නෙන් හැඟවෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ අර්තාපල් වල පමණක් බර බවද නියම කරමි.

1958 ඔක්තෝබර් 20 වැනි දින අ. භා. 3.30 ට මාතර කච්චේරියේ දී අත්සන් කරන ලදී.

එච්. ඩී. ටී. බෝදිදස,
මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන.

## 1 වැනි උපලේඛනය

### ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අර්තාපල්<br>රු. ශ. |
|---|---|
| මාතර නගර සභා සීමාව<br>දෙවිනුවර සුළු නගර සභා සීමාව<br>දෙවිනුවර ගම් කාර්ය සභා සීමාව<br>කැකනදුර ගම් කාර්ය සභා සීමාව<br>මඩිහ ගොඩගම ගම් කාර්ය සභා සීමාව<br>මාලිම්බඩ ගම් කාර්ය සභා සීමාව<br>මොලොද්දුව ගම් කාර්ය සභා සීමාව<br>නායිමන–මාකාවිට ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 31 00 |
| වැලිගම නගර සභා සීමාව<br>වැලිගම ගම් කාර්ය සභා සීමාව ... ... ... ... | 30 90 |
| අකුරැස්ස ගම් කාර්ය සභා සීමාව<br>ගොඩපිටිය ගම් කාර්ය සභා සීමාව ... ... ... ... | 31 25 |
| කඹුරුපිටිය ගම් කාර්ය සභා සීමාව<br>හක්මන ගම් කාර්ය සභා සීමාව<br>කන්දපිටවලකඩ ගම් කාර්ය සභා සීමාව<br>දික්වැල්ල ගම් කාර්ය සභා සීමාව ... ... ... ... | 31 45 |
| මොරවක ගම් කාර්ය සභා සීමාව ... ... ... ... ... | 31 50 |
| බෙරලපනාතර ගම් කාර්ය සභා සීමාව<br>දෙනියාය ගම් කාර්ය සභා සීමාව ... ... ... ... | 31 75 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

## 2 වැනි උප ලේඛනය

ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අර්තාපල්<br>රු. ශ. |
|---|---|
| මාතර නගර සභා සීමාව<br>දෙවිනුවර සුළු නගර සභා සීමාව<br>දෙවිනුවර ගම් කාර්‍ය සභා සීමාව<br>කැකනදුර ගම් කාර්‍ය සභා සීමාව<br>මඩිහ ගොඩගම ගම් කාර්‍ය සභා සීමාව<br>මාලිම්බඩ ගම් කාර්‍ය සභා සීමාව<br>මොලොද්දුව ගම් කාර්‍ය සභා සීමාව<br>නායිමන-මාකාවිට ගම් කාර්‍ය සභා සීමාව<br>වැලිගම නගර සභා සීමාව<br>වැලිගම ගම් කාර්‍ය සභා සීමාව<br>අකුරැස්ස ගම්කාර්‍ය සභා සීමාව<br>ගොඩපිටිය ගම් කාර්‍ය සභා සීමාව<br>කඹුරුපිටිය ගම් කාර්‍ය සභා සීමාව<br>හක්මන ගම් කාර්‍ය සභා සීමාව<br>කන්දපිට වලකඩ ගම් කාර්‍ය සභා සීමාව<br>දික්වැල්ල ගම් කාර්‍ය සභා සීමාව<br>මොරවක ගම් කාර්‍ය සභා සීමාව<br>බෙරලපනාතර ගම් කාර්‍ය සභා සීමාව<br>දෙනියාය ගම් කාර්‍ය සභා සීමාව ... ... ... ... | 0·33 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

---

ඇම්ටී. 12/58 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන්පත් හෙට්ටිගේ දොන් වියුඩර් බෝදිදස වන මම, 1950 අංක 29 දරණ මිළ පලන පනතේ 4 වැනි සහ 3(2) යන කොටස්වලින් මා වෙත පැවරි තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 23 වැනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනලද 1958 අගෝස්තු 18 වැනි දින ඇ.ම්.ටී.9/58 දරණ ආහාර මිළ නියෝගයේ 1 වැනි සහ 2වැනි උපලේඛනවල 5 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව එම උපලේඛන වල පිළිවෙලින් සඳහන් තොර වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිලද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනවල 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද එම උප ලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දුන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියමකරමි.

(3) මෙම උපලේඛනවල 2 වැනි තීරයේ සඳහන් වියලි මිරිස් පිළිබඳව 1958 අගෝස්තු 23 වෙනි දින අංක 11,480 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරනලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 18 වෙනි දින ඇම්ටී/9/58 දරණ ආහාර මිළ නියෝගයේ (3) සිට (8) දක්වා ඡෙදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළ කිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් 3 වැනි දින ප. ව. 2.30 ට මාතර කච්චේරියේදී අත්සන් කරනලදී.

එච්. ඩී. ටී. බෝදිදස,
මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළපාලක තැන.

## 1 වැනි උපලේඛනය

දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>වියලි මිරිස්<br>රු. ශ. |
|---|---|
| මාතර නගර සභා සීමාව, දෙවිනුවර සුළු නගර සභා සීමාව, දෙවිනුවර ගම්කාර්‍ය සභා සීමාව, කැකනදුර ගම්කාර්‍ය සභා සීමාව, මාලිම්බඩ ගම්කාර්‍ය සභා සීමාව, මොලොද්දුව ගම්කාර්‍ය සභා සීමාව, නායිමන මාකවිට ගම්කාර්‍ය සභා සීමාව මඩිහගොඩගම ගම් කාර්‍ය සභා සීමාව ... ... ... ... ... | 88 0 |
| වැලිගම නගර සභා සීමාව, වැලිගම ගම්කාර්‍ය සභා සීමාව ... ... ... ... | 87 90 |
| අකුරැස්ස ගම්කාර්‍ය සභා සීමාව, ගොඩපිටිය ගම් කාර්‍ය සභා සීමාව, ... ... ... ... | 88 25 |
| කඹුරුපිටිය ගම්කාර්‍ය සභා සීමාව, හක්මන ගම්කාර්‍ය සභා සීමාව, කන්දපිට වලකඩ ගම් කාර්‍ය සභා සීමාව, දික්වැල්ල ගම් කාර්‍ය සභා සීමාව ... ... ... ... ... | 88 45 |
| මොරවක ගම් කාර්‍ය සභා සීමාව ... ... ... ... ... ... | 88 50 |
| බෙරලපනාතර ගම් කාර්‍ය සභා සීමාව, දෙනියාය ගම් කාර්‍යසභා සීමාව ... ... ... ... | 88 75 |

සැළකිය යුතුයි.—මේ මිළගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මෙකී මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

## 2 වැනි උපලේඛනය

**ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල**

| 1 වැනි තීරය<br>**ප්‍රදේශය** | 2 වැනි තීරය<br>**වියළි මිරිස්**<br>රු. ශ. |
| --- | --- |
| මාතර නගරසභා සීමාව, දෙවිනුවර සුළු නගර සභා සීමාව, දෙවිනුවර ගම්කායර් සභා සීමාව, කැකනදුර ගම් කායර් සභා සීමාව, මඩිහගොඩගම ගම් කායර් සභා සීමාව, මාලිම්බඩ ගම් කායර් සභා සීමාව, මොලොද්දුව ගම්කායර් සභා සීමාව, නායිමන මාකාවිට ගම් කායර් සභා සීමාව, වැලිගම නගර සභා සීමාව, වැලිගම ගම් කායර් සභා සීමාව, අකුරැස්ස ගම් කායර් සභා සීමාව, ගොඩපිටිය ගම් කායර් සභා සීමාව, කඹුරුපිටිය ගම්කායර් සභා සීමාව, හක්මන ගම් කායර් සභා සීමාව, කන්ද පිට වලකඩ ගම් කායර් සභා සීමාව, දික්වැල්ල ගම් කායර් සභා සීමාව, මොරවක ගම් කායර් සභා සීමාව, බෙරලපනාතාර, ගම් කම්යර් සභා සීමාව, දෙනියාය ගම් කායර් සභා සීමාව ... ... ... ... ... ... | 0 94 |

**සැළකිය සුතුයි.**—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමෙ නියමිත මිළ නොවේ. මෙවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය මේ මිල ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

---

**52 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

### 1950 අංක 29 දරණ ආහාර මිළ පණත

**නියෝගය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 3(2) වගන්තිය හා කියවෙන 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) පහත සඳහන් ආහාර මිළ නියෝග අද දින සිට මෙයින් අවලංගුකරමි :—

1958 සැප්තැම්බර් 2 වැනි දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1958 අගෝස්තු 26 වන දින අංක 50 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් අර්තාපල් පිළිබඳව එම උපලේඛනයෙහි 2 සිට 7 දක්වා ඇති තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගුකරමි.

(ii) මිට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය, තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී ශුඩ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම නියෝගයේ කායර් සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් වරකට ශුද්ධ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියමකරමි.

(iv) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියමකරමි.

(v) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරනලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබියයුතු බව නියමකරමි.

(vi) එසේම මෙම නියෝගයේ කාය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියමකරමි.

(vii) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියකරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම, මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව);
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියමකරමි.

(viii) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 2 සිට 5 සහ 6 සිට 7 දක්වා ඇති තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බවද නියමකරමි.

(ix) ජපානයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් විසිපහක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(x) චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(xi) ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(xii) ලෑලි පෙට්ටිවල හැර වෙන යම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(xiii) මෙම නියෝගය සඳහා ''ශුද්ධ'' යන්නෙන් හැඟවෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ අර්තාපල් වල පමණක් බර බවද නියමකරමි.

1958 නොවැම්බර් මස 3 වන දින පස්වරු 4ට හම්බන්තොටදී අත්සන්කරනලදී.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන,
පාලන දිස්ත්‍රික්කය, හම්බන්තොට.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වනි තීරය | 4 වැනි තීරය | 5 වැනි තීරය | 6 වැනි තීරය | 7 වැනි තීරය |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
| | බෙලිඅත්ත, තංගල්ල, දෙද්දූවාවල, මහවෙල | හම්බන්තොට, අම්බලන්තොට, වලස්මුල්ල, රන්න, වීරකැටිය | තිස්ස | කටුවන, කිරම, මිද්දෙනිය | බටහිර ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | මාගම්පත්තුවේ සහ නැගෙණහිර ගිරුවාපත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| අර්තාපල් ... ... | 31 02 ... | 31 37 ... | 31 67 ... | 31 52 ... | 0 33 ... | 0 34 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉහාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළී ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**නො. වී. 52 දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

වවුනියා දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන්පත් පරරාජසේකරම් පිල්ලේ තම්බයියා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවියයුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පවරා තිබෙන බලතල අනුව මේ නියෝගයෙන්—

(1) 1958 අගෝස්තු 29 වෙනි දින අංක 11,508 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු 25 වෙනි දින නො. 50 දරණ ආහාර මිළ නියෝගයේ 1 වන තීරයෙහි සඳහන් අර්තාපල් පිළිබඳව එම 1වෙනි උපලේඛනයේ සඳහන් පරිදි තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මිට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පරිභෝගයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද මිට යාකර ඇති 2වැනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ ගණන් මේ දුන් පටන් මේ උපලේඛනයේ 2වැනි සහ 3වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයෙහි කාර්ය සඳහා—

(i) ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට රාත්තල් 28ක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීයක් ලෙස සලකනු ලබන බවත්,

(ii) පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිය හෝ රා. 28කට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක හෝ උපලේඛනයේ 1වෙනි තීරයෙහි සඳහන් ද්‍රව්‍ය සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ 1වැනි තීරයෙහි සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලැබෙන්නේ ඇවැර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ පළමු වන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(i) විකුණූ දිනය,

(ii) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි),

(iii) විකිණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,

(iv) වෙළඳාමෙහි ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග,

(v) විකුණූ ද්‍රව්‍ය පිළිබඳව විස්තරය ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බව මෙයින් නියම කරමි.

(8) උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍ය විකුණුවිට ඒ විකුණන ලබන ද්‍රව්‍ය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිලත් උපලේඛනයේ 2වැනි සහ 3වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(9) ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දලබර තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් 10යක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(10) චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළබරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් 13ක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(11) ජපානයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළබරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් 25ක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(12) ලැලි පෙට්ටිවල හැර වෙන යම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(13) මෙම නියෝගය සඳහා ''ශුද්ධ'' යන්නෙන් හැඟවෙන්නේ දළබරින් තාර බර අඩුකොට ඉතිරි බර හෝ අර්තාපල් වල පමණක් බර බවද නියම කරමි.

1958 ඔක්තෝබර් මස 21 වැනි දින උදේ 11ට වවුනියාවේ කච්චේරියේදී අත්සන් කරන ලදී.

පී. තම්බයියා,
වවුනියා දිස්ත්‍රික්කයේ උප (ආහාර) පාලක තැන.

## පළමුවැනි උපලේඛනය

වවුනියාවේ දෙමළ ආදයම් පාළක නිළධාරිතැනගේ කොට්ඨාශයේ ආසිකුලම, වවුනියාව, නොච්චිමොදයි, නෙඳුම්කුලම්, පූදුකුලම් සහ වවුනියාවේ සිංහල ආදයම් පාලක නිළධාරි තැනගේ කොට්ඨාශයේ මඩුකන්ද සහ ඊරට්පෙරියකුලම

| 1 වැනි තීරය<br>විස්තර | 2 වැනි තීරය<br>හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. අර්තාපල් ... ... ... | 31 40 | 0 33 |

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>කොට්ඨාශය | 2 වැනි තීරය<br>හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් ගණන්වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි<br>රු. ශ. | | 3 වැනි තීරය<br>රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් ගණන්වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි<br>රු. ශ. |
|---|---|---|---|
| 1. ආදයම් පාලක දිස්ත්‍රික්කය (දෙමළ) මරුදන්කුලම්, මරදමඩු, රාසේද්‍රකුලම්; ආදයම් පාලක දිස්ත්‍රික්කය(සිංහළ) මරදමඩුවහැරසුදුවැන්දපුලවු සහ උළුකුලම ... ... | 0 25 | ... | 0 01 |
| 2. ආදයම්පාලක දිස්ත්‍රික්කය (දෙමළ) පෙරියපුලියන් කුලම,වාකයිකුඩ්ඩනා,ඕලුකුලම්,වලයිවෙතාල කුලම්, සහ සිංහළ ආදයම් පාලක දිස්ත්‍රික්කයේ උළුකුලම කොට්ඨාශයේ මරදමඩුව ... | 0 50 | ... | 0 01 |
| 3. වවුනියා උතුර ආදයම් පාලක දිස්ත්‍රික්කයේ නෙඩුන් කර්නි, මාන්කුලම්, ඕලුමඩුකනගරායන් කුලම් සහ පුලියන්කුලම් ... ... | 0 50 | ... | 0 01 |
| 4. වවුනියාවෙ උතුරු ආදයම්පාලක දිස්ත්‍රික්කයේ පරන්තන්, මනවාලන්,පට්ටමුරිප්පු,තන්ඩුවාන්, කණලාමඩු, කච්චල්කොඩි ... | 0 75 | ... | 0 02 |
| 5. වවුනියාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම් පාලක දිස් ත්‍රික්කයේ මුල්ලිය වලෙයි, තන්නියුත්තු, මුල තිව්, වල්ලාමුල්ලි වයිකාල් ... ... | 1 00 | ... | 0 02 |
| 6. මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම්පාලක දිස්ත්‍රික්කයේ කුමුලමුනෙයි පුදුකුඩියිරිප්පු, අම්බලවන්පොයි කාල් ... ... ... | 1 25 | ... | 0 02 |
| 7. මුහුදුබඩ ප්‍රදේශයේ ආදයම්පාලක දිස්ත්‍රික්කයේ කෝකිලායි සහ කොක්කුතොඩුවායි ... | 1 50 | ... | 0 03 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

---

**බී.ඊ.60 වැනි අංකය දරන ආහාර මිළ නියෝගය.**

**අතිරේක ආහාර ද්‍රව්‍ය**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් වික්‍රමසිංහ පතිරණ වන මම මිළ පාලන පනතේ 3 (2) වගන්තියත් සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ ආහාර මිළ පාලක තැන කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

(අ) 1958 අගෝස්තු මස 27 වෙනි දින අංක බී.ඊ. 58 දරණ ආහාර මිළ නියෝගයද, 1958 සැප්තැම්බර් මස 2වෙනි දින හා අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද එහි සඳහන් පළමුවෙනි, දෙවෙනි උපලේඛනවල 5 වෙනි තීරයේ සඳහන් වියලි මිරිස් විකිණීමේ තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(ආ) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දල බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද මෙහි පළමුවෙනි, දෙවෙනි, උපලේඛනවල සඳහන් මඩකලපු දිස්ත්‍රික්කයේ ප්‍රදේශවල පළමුවෙනි, දෙවෙනි උපලේඛනයන්හි දෙවෙනි තීරයේ උඩින් සඳහන් ද්‍රව්‍යවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් විකිණිය හැකි වැඩිම මිළ, මේ දන් පටන් මෙ පළමුවෙනි, දෙවෙනි උපලේඛනයන්ගේ 2වෙනි තීරයේ අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙමම නියෝගයෙන් නියෝග කරමි.

(ඇ) 1 වෙනි හා 2 වෙනි උපලේඛනවල සඳහන් වියලි මිරිස් පිළිබඳව 1958 අගෝස්තු මස 27 වෙනි දින අංක බී.ටී. 58 දරණ ආහාර මිළ නියෝගයද, 1958 සැප්තැම්බර් මස 2 වෙනි දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ද්‍රව්‍ය සම්බන්ධ 3 වෙනි සිට 8 වෙනි දක්වා ඡෙදයන්, මෙමම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැලකිය යුතු ලෙසද මෙමම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් මස 3 වෙනි දින පස්වරු 2ට මඩකලපුවේදී අත්සන් තබන ලදී.

ඩබ්ලිව්. පතිරණ,
මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන.

## පළමුවැනි උපලෙඛනය

**යට සඳහන් ප්‍රදේශ වල තොග වෙළඳාමේ දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ**

| ද්‍රව්‍ය | කෝරළේ උතුර, කෝරළේ මධ්‍යම හා කෝරළේ දකුණ ගම්සභා ප්‍රදේශ අත්හැර මන්මුන උතුර, මන්මුන දකුණ, නැගෙනහිර සහ එරුවිල් පෝරතිව්, එරාවූර් කෝරළේ පත්තු යන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශ | කෝරළේ පත්තුවේ උතුර, කෝරළේ මධ්‍යම හා කෝරළේ දකුණ | කරවාකු හා සමාන්තුර පත්තු ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශ | අක්කර පත්තු බින්තැන්න හා වැව්ගම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිළධාරීන්ගේ කොට්ඨාශ | පානම පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශ |
|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... | 91 50 ... | 91 90 ... | 92 0 ... | 92 20 ... | 92 50 |

## දෙවැනි උපලේඛනය

**යට සඳහන් ප්‍රදේශවල සිල්ලර වශයෙන් විකිණීමේදී විකිණිය හැකි වැඩිම මිළ**

| ද්‍රව්‍ය | මන්මුන උතුර-බස්නාහිර ගම්සභාව ප්‍රදේශය අත්හැර මන්මුන උතුර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිතැනගේ කොට්ඨාශය | මන්මුන උතුර බස්නාහිර ගම්සභා ප්‍රදේශ තුල මන්මුන දකුණ බස්නාහිර, එරුවිල් පෝරතිව්, කරවාකු, සමාන්තුර, අක්කර පත්තු, පානම, එරාවූර් කෝරළේ, බින්තැන්න සහ වැව්ගම පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| වියලි මිරිස් ... ... | 0 91 ... | 0 92 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන ඉහතින් සඳහන් කරන ලද ද්‍රව්‍යයන් විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතා ම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**අංක බී. ටී. 61 දරණ ආහාර මිළ නියෝගය.—**

**අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක නිලධාරී වික්‍රමසිංහ පතිරණ වන මම 1950 අංක 29 දරණ ආහාර මිළ පාළන පනතේ (3 2) වගන්තියත් සමග කියවියයුතු 4 වෙනි වගන්තිය යටතේ මට ලැබී ඇති බලතල අනුව මම මෙසේ නියෝග කරමි:

2. (අ) 1958 සැප්තැම්බර් මස 2 වෙනි දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 අගෝස්තු මස 27 වෙනි දින අංක බී.ටී. 58 දරණ මගේ ආහාර මිළ පාළන නියෝගයේ සඳහන් පළමුවෙනි සහ දෙවෙනි උපලේඛනයන්ගේ 11 වෙනි තීරයේ සඳහන් ආර්තාපල් පිළිබඳ, එහි සඳහන් ප්‍රදේශ ඇතුලත පමණක් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩි මිළද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩි මිළද, මෙමම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(ආ) මීට යාකර ඇති පළමුවෙනි, දෙවෙනි උපලේඛනයන්හි 2 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේ දී දල බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, ඉහත කී උපලේඛනයන්ගේ 1 වෙනි තීරයන් ගේ සඳහන් සීමාවන් ඇතුලත, විකණිය හැකි වැඩිම මිළ, මේ දන් පටන් මේ පළමුවෙනි දෙවෙනි උපලේඛනයන්ගේ 2 වෙනි තීරයේ අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙමම නියෝගයෙන් නියම කරමි.

3. තවද මෙමම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) ද්‍රව්‍ය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා හෝ කිසිම ද්‍රව්‍යයක් වරකට හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දල බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

4. එසේම මෙමම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උප ලේඛනයන් ගේ පළමුවෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් හෝ බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

5. තවද මෙමම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයන්ගේ දෙවෙනි තීරයේ උඩින් සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශයේ විකිණීම සඳහා උප ලේඛනයන්ගේ 2 වෙනි තීරයේ උඩින් සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙමම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

6. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශකම උපලේඛනයන්ගේ 2 වෙනි තීරයේ උඩින් සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්, මිළයට ගන්නා විසින් ඉල්ලා සිටියොත් පහත සඳහන් විස්තර ඇතුලත් කුවිතාන්සියක් දියයුතු බව නියම කරමි.

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ද්‍රව්‍ය ප්‍රමාණයේ බර ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳමේ ස්වභාවය, එනම් වෙළඳම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යනවග;

(ඉ) විකුණූ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය.

7. එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා '' රාත්තල '' නොහොත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ '' ඇවෝර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලක බර'' බවද නියම කරමි.

8. එසේම මෙම උපලේඛනයන්ගේ දෙවෙනි තීරයේ උඩින් සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය ඔතා හෝ බහා දෙන යම් කිසි දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයේ සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුලත් වන බවද නියම කරමි.

9. එසේම ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට, දල බරින් රාත්තල් 10ක් තාර බර වශයෙන් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගතයුතු බවද නියම කරමි.

10. එසේම චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද ආර්තාපල් විකුණන විට දල බරින් රාත්තල් 13 ක් එක පෙට්ටියක තාර බර වශයෙන් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතුයි.

11. එසේම ජපානයේ ලෑලි පෙට්ටිවල ගෙන්වනලද ආර්තාපල් විකුණනවිට දලබරින් රාත්තල් විසිපහක් එක පෙට්ටියක තාර බර වශයෙන් අඩු කොට ඉතිරි බර අනුව මිළ ගණන් ගතයුතුයි.

12. එසේ ලෑලි පෙට්ටිවල හැර වෙන යම් කිසිවක අර්තාපල් බහා විකිණීමේදී බහා ඇති එම එක එක බණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩු කොට ඉතිරි බර අනුව මිළ ගණන් ගත යුතුයි.

13. තවද මෙම නියෝගයේ කාර්‍ය සඳහා '' ශුද්ධ '' යන්නෙන් අදහස් කරන්නේ දල බරින් තාර බර අඩුකොට හෝ අර්තාපල් වල බර පමණක් බවද නියම කරමි.

1958 නොවැම්බර් මස 3 වෙනි දින පස්වරු 2ට, මඩකලපුවේ දී අත්සන්කරන ලදී

වික්‍රමසිංහ පතිරණ,
මඩකලපුවේ නියෝජ්‍ය ආහාර මිල පාලක තැන.

## 1 වැනි උප ලේඛනය

**යට සඳහන් ප්‍රදේශවල තොග වෙළඳාමේ දී දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ**

| පළමුවෙනි තීරය | දෙවෙනි තීරය අර්තාපල් රු. ශ. |
|---|---|
| 1. කෝරළේ උතුර, කෝරළේ මධ්‍යම, හා කෝරළේ දකුණ ගම්සහා ප්‍රදේශ අත්හැර මන්මුන උතුර මන්මුන් දකුණ–නැගෙණ හිර සහ එරුවිල් පෝරතිව්, එරාවූර් කෝරසේ පත්තු යන ප්‍රදේශීය ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශ ... | 34 50 |
| 2. එරවූර් කෝරලේ පත්තුවේ, කෝරලේ පත්තුවේ උතුර, කෝරලේ මධ්‍යම සහ කෝරලේ දකුණ යන ගම් සහා ප්‍රදේශ වල ... | 34 90 |
| 3. සමන්තුර හා කරවකු පත්තු ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශ ... ... ... ... | 35 0 |
| 4. අක්කර පත්තු, බින්තැන්න හා වැව් ගම් පත්තු ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීන් ගේ කොට්ඨාශ ... ... | 35 20 |
| 5. පානම පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... ... | 35 50 |

## 2 වැනි උප ලේඛනය

**යට සඳහන් ප්‍රදේශවල සිල්ලර වශයෙන් විකිණීමේදී විකිණිය හැකි වැඩිම මිළ**

| පළමුවෙනි තීරය | දෙවෙනි තීරය අර්තාපල් රු. ශත |
|---|---|
| 1. මන්මුන උතුරු බස්නාහිර ගම්සහා ප්‍රදේශය හැර මන්මුන උතුර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කොට්ඨාශ ... | 0 37 |
| 2. මන්මුනඋතුරු බස්නාහිර ගම් සහා ප්‍රදේශය තුල මන්මුන දකුණු–බස්නාහිර එරුවිල් පෝරතිව්, කරවකු සමාන්තුර අක්කර පත්තු, පානම එරාවූර් කෝරල, බින්තැන්න සහ වැව් ගම් පත්තුවේ ප්‍රදේශීය ආදායම් පාලක නිලධාරීනගේ කොට්ඨාශ ... | 0 38 |

**සැලකිය යුතුයි:**—මේ මිළ ගණන් ඉහතින් සඳහන් කරන ලද ද්‍රව්‍යයන් විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍ය යන් විකිණිය නොහැකිය.

---

53 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය. අතිරේක ආහාර ද්‍රව්‍ය.

## 1950 අංක 29 දරණ ආහාර මිළ පනත

### නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 3(2) වගන්තිය හා කියවෙන 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 4වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) පහත සඳහන් ආහාර මිළ නියෝග අද දින සිට මෙයින් අවලංගු කරමි :—

1958 සැප්තැම්බර් 2 වන දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1958 අගෝස්තු 26 වන දින අංක 50 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් වියළි මිරිස් පිළිබඳව එම උපලේඛනයේ 2 සිට 7 දක්වා ඇති තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර මිළ ද මෙම නියෝගයෙන් අද සිට අවලංගුකරමි.

(ii) මීට යාකර ඇති උපලේඛනයේ 1වැනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය, තොග වෙළෙන්දකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) මෙම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වියළි මිරිස් පිළිබඳව, 1958 සැප්තැම්බර් මස 2 වන දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 අගෝස්තු 26 වන දින, 50වෙනි ආහාර මිළ නියෝගයේ (2) සිට (8) දක්වා ඡේදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැළකියයුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 නොවැම්බර් මස 5 වන දින පෙරවරු 10ට හම්බන්තොටදී අත්සන් කරන ලදී.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය ආහාර මිළ පාලකතැන,
පාලන දිස්ත්‍රික්කය, හම්බන්තොට.

උප ලේඛනය

| 1 වැනි තීරය | දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
|---|---|---|---|---|---|---|
| | **2 වැනි තීරය** බෙලිඅත්ත, තංගල්ල දෙද්දුවාවල මහවෙල | **3 වැනි තීරය** හම්බන්තොට අම්බලන්තොට වලස්මුල්ල රන්න, වීරකැටිය | **4 වැනි තීරය** තිස්ස | **5 වැනි තීරය** කටුවන, කිරම මිද් දෙනිය | **6 වැනි තීරය** බටහිර ගිරුවා පත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | **7 වැනි තීරය** මාගම් පත්තුවේ සහ නැගෙණහිර ගිරුවාපත්තුවේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| වියළිමිරිස් ... ... | 87 30 ... | 87 65 ... | 87 95 ... | 87 80 ... | 0 86 ... | 0 87 |